

# විනය
# අපටිච්ඡන්නතාව
# විනිශ්චය.

විනය

# අපටිවිජ්ජනනාභාව

**විනිශ්චය**

හෙවත්

විනය පටිවිජ්ජනනා පටිවිජ්ජනනාභාවය

සම්බඳව, අනුරුවැල්ල නම් ගමේ කරන්ට

යෝජනා කරණලද

**විවාදයෙහි විනිශ්චය.**

**පී. ඒ. පීරිස් විසින්**

සම්පාදනය කරණ ලදී

---

**බී. ඩී. සාද්‍රිස්ද සිල්වා විසින්**

ප්‍රසිද්ධකරණ ලදී

**කොළඹ**

"ඉම්පීරියල්" මුද්‍රා යන්ත්‍රාලයෙහි

අච්චුගස්වනලදී.

**1892.**

# සංක්‍ෂෙපනය.

**ලක්දිවිහි** මෙකල පවත්නා අනෙක ප්‍රකාර විවාදයන් අතුරෙන් "විනය පටිච්ඡන්නය" කීම පිළිබඳව පවත්නා විවාදයද, විස්තීර්ණව පවති. මෙම විවාදය කලින්කල නොයෙක් ගම්හි කරණලද නමුත්, සත්‍යය හෙළිවීමට යොග්‍යවූ පරිද්දකින් නොකරණ ලද්දේය. පසුගියදා අතුරුවැල්ලනම් ගමේ කෙරුණ පින්කම කරණ කොටගෙණ, සියමනිකායික භික්ෂූන් වහන්සේලාගේ අනුමතය ඇතුව එම නිකායෙහි **දායකවරු** මෙම විවාදය කෙරීමට එහිදි ආරම්භකොට, පොරොන්දු පත්‍රලියා අත්සන් තබා නැවත විවාදයට **නොපැමිණ මගහැරියෝය** එහෙයින්එහි **රහස** ලොකයාට තේරුම් ගැණීමට හා **විනයඅපටිච්ඡන්නම** බැව් තේරුම් ගැණීමටත්, දෙශනා අට්ඨකථාදියෙන් කරුණු අත්‍යාශ්‍රිතකොට මෙම පොත සම්පාදනය කලෙමු. මෙකී පින්කම කෙරීමට මත්තෙන් ඒ සඳහා සිදුවූනා කරුණු මෙහි සංක්‍ෂෙපනයින් ප්‍රකාශකරණ ලද්දේ, එම පින්කමේ දායකවරුන්ගෙන් මනාකොට අසාදැනගත් පරිද්දෙනි. ඊට ඉක්බිතිව දක්වනලද ලිපුම් පිටපත් **කොර්නේලිස්** අප්පුහාමිගෙන් සහ **සුමනතිස්ස** ස්ථවිරපාදයන්වහන්සේ ගෙනුත් ලබාගතිමු. විනය අපටිච්ඡන්න බව සාධක වශයෙන් දෙශනා අට්ඨකථාදියෙන් දක්වා තිබෙන පාඨ හා එහි භාවය අපේ යාච්ඤාවලෙස, ධර්ම විනයධර ස්ථවිරයන්වහන්සේ නමක් විසින් සඞ්ග්‍රහ කරදෙනලදි.

විනය පටිච්ඡන්නද ? අපටිච්ඡන්නද ? යන විනිශ්චයකට පැමිණිය නොහැකිව විචිකිච්ඡාවෙන් යුක්තව වසන බෞද්ධයන්ට විනය **අපටිච්ඡන්නම** බැව්දැනගැණීමට, මෙම පොත ඉතා ප්‍රයොජනවේ. මෙහි 1 වෙනි පිටේ 2 වෙනි පෙලේ "අපටිච්ඡන්න" යන තැනට "අපටිච්ඡන්නභාව"යි සොදාගතයුතුවන්හැර, 5 වෙනි පිටේ 16 වෙනි පෙලේ "කොර්නේලිස්ද අල්විස්,,යි තිබෙන තැනට "කරෝලිස්ද අල්විස්,,යිද, 23 පිටේ 11 පෙලේ "සසඞ්කසාර" යන තැනට "සඞ්කසාර"යිද, 24 පිටේ 16 පෙලේ "මහා නිරය" යන තැනට "මහා නිරයෙ"යිද සොදා ගතයුතුයි. තවත් සිද්ධිපත්‍ර බැලීමේදී නොපෙණී ගියාවූ හ්‍රස්වවියයුතු වර්ණ දීර්ඝවීමද, දීර්ඝවියයුතු වර්ණ හ්‍රස්වවීමද යනාදිය, වර්ණ යොජකයන්ගෙන්යෙදී ඇතත් අර්ථ සුබොධය විපරීත නොවෙතැයි, හැඟෙණ බැවින් අමුතුවූ ශුද්ධිපත්‍රයක් නොයෙදිමු.

P. A. Peiris.

### විනය

# අපටිවිජානන

### විනිශ්චය.

බෙත්තර වලල්ලාවිටිකෝරළේ අතුරුවැල්ල යන ගමේ පදිංචි, බෙත්ඩරගේ **කොර්ණේලිස්අප්පුහාමි** ප්‍රධාන කොට ඇති එගම්වාසී සැදැහැවත් මහතුන් විසින් පින්කමක් කෙරීමට, සම්මතයක් කරගන්නාලද්දේය. ඒ පිණිස නවකම්මානතයෙන් යුත් ධම්මශාලාවක් සහ ලැගුම්ගෙවල් ආදී සියලුම උවමනාදෙය මහත් වියදම් කොට සෑදවූයේය. ඉක්බිති පින්කමට **භික්ෂුසඞ්ඝයා** පමුණුවාගැනීම සඳහා ආරාධනාකෙරීමට, **කොර්ණේලිස් අප්පුහාමිගේ** නියමයලත්, **ඩී. ඒ. ඩී. සිල්වා** උන්නැගේ ආදී කීප දෙනෙක්, පසුගිය අප්‍රේල්මස 24 වෙනිදින, ගලපාතවිහාරස්ථානයට ගියෝය. එකල්හී මහනුවරපලාතේ, **අනුනායක** තෙරුන්නාන්සේනමක්ද, සූරියගොඩ **සොනුත්තර**තෙරුන්නාන්සේද, තවත් විසිතුන්නමක් පමණ **භික්ෂුහු**ද, එහි පැමිණ විසූහ.

යථෝක්ත දායකවරුන් විසින් තම ආරාධනාව මොරගොඩ **රතනපාල**තෙරුන්නාන්සේට කෙරීම පිණිස දැහැත් පිළිගන්වන්ට ආරම්භකළ කල්හි, උන්වහන්සේ විසින් ප්‍රධාන ස්ථවිර නමක්වූ **අනුනායක** තෙරුන්නාන්සේට ඒ දැහැත් පිළිගන්වා ආරාධනාව කරන්ට කියනලදී. එවිට දායකවරු එපරිද්දෙන් දැහැත් පිළිගන්වා, පින්කම කෙරීමට නියමකර ගන්නාලද කාලයේ ප්‍රථම සතියෙහි **විනයබණ**ද, දෙවෙනි සතියෙහි **සූත්‍රබණ**ද, තුන්වෙනි සතියෙහි **පිරිත්බණ**ද, පවත්වන්ට ඕනෑයයිආරාධනා කළෝය.

ඉක්බිති **අනුනායක**තෙරුනාන්සේ සහ සූරියගොඩ **සොනුත්තර**තෙරුන්නාන්සේ ආදී උගත් කීප නමක් විසින් පෙර විනය දේශනා කළ බවක්ද කථාකොට. මේ පින්කම කෙරීමට බාරගත් බව ප්‍රකාශ කරණලද්දේය. එයින් පසු දන් සීට්ටු යැවීමාදිය කරන් මයයි දායකවරුන්ට **රතනපාල**තෙරුන්නාන්සේ කියාසිටි බැවින් ඔවුන් ගමට පැමිණ ඒ එසේ කරණලද විය.

මෙසේ කී පරිද්දෙන් ආරාධනාව කර දවස් අටක් ගතවූන කල්හි (මැයිමස 2 වෙනි සඳුදින) **රතනපාල**තෙරුන්නාන්සේ අතුරුවැල්ලේ මැදගොඩ පන්සලට පැමිණ, දායකවරුන්ගෙන්වා "**විනයබණ කියන්ට සඞ්ඝයා නැත**" කීවේය. ඊට අප්‍රසන්නවූ දායකවරුන් සතුටු කෙරීම පිණිස, මැයිමස 4 වෙනිදින, හොරවල,

**ගෝණගල**, **කසිකාවල**, මහගොඩ, ගොරකදූවේ, **රන්තොටුවිල**, කොල්ළුපිටියේ **සිරිසොභිත**, එම **රතනපාල**, යන භික්ෂූන්වහන්සේලා අටනම විසින් විනයබණ කීම සහිත පින්කම කෙරීමට නැවත බාරගන්නා ලද්දේය. එසේ බාරගත් භික්ෂූන්වහන්සේලාගෙන්, යාලගම **අගෝනිස්** වඩුරාල මෙසේ විචාළේය.

"හික්කඩුවේ **නායකහාමුදුරුවන්** ගෙන් මේපින්කමට සඬසයා නොලැබුණොත්, මුලදී බැරිය කී වාක්මෙන් නැවතත් බැරිය කියා දායකවරුන්ට හිරිහැර කරණවාද?''යනුයි. ඊට, **නායකහාමුදුරුවන්**ගෙන් සඬසයා ලැබුනත්,නොලැබුනත්, විනයබණකීම තහනම්කළත් මේ වර පින්කම කරණවාමයයි එහි සිටි සියළුම භික්ෂූන්වහන්සේලාගේ සමකැමැත්තෙන් **ගෝණගල**තෙරුන්නාන්සේ උත්තරදුන්තේය. මෙයින් පසු එම මස 8 වෙනි ඊව්දින, **රතනපාල**තෙරුන්නාන්සේ දායකවරුන්ගෙන් රුපියල් 2, ශත 50 ක් ඉල්ලාගෙණ, **හික්කඩුවේනායක** ස්ථවිරයන්වහන්සේගෙන් විනයබණකීමට සඬසයාලබා ගැණීමපිණිස කථාකරගන්ට විද්‍යොදයපිරිවෙණට ගියේය. එහි ගොස් නායකස්ථවිරයන්වහන්සේ සමග කථා කරගෙණවිත්, කසිකාවල **රේවත**තෙරුන්නාන්සේද, වැදගත් දායක පිරිසක්ද කැටුව 10 වෙනි දින අතුරුවැල්ලේ ධම්මශාලාවට පැමිණ මෙසේ ප්‍රකාශකළේය. "මහත්වරුනි, මම පිරිවෙනට පැමිණ නායකහාමුදුරුවන් සමග පින්කම පිළිබඳ කාරුණුකියා සඬසයා ඉල්වම්, ඊට නායකහාමුදුරුවෝ **ගිහින්ට** විනයබණ කීම තහනම්කර තිබෙත්ය, බුද්ධාගමේ ඉඳගෙණ විනය කියන අයද, ඒ අසන ගිහියෝද මිථ්‍යාදෘෂ්ටිකයෝ වෙනවාය''යනුයි. එහෙයින්, තමුසේලාගේ ආරාධනාව මම බාරගත් නමුත් මට බුඩ ප්‍රඥප්තියකඩන්ට බැරිය කීවේය. එවිට ඉඳුරුවේ ආණ්ඩුවේ පාඨශාලාවේ ගුරුන්නාන්සේ විසින් "විනය කියන්ට බැරිනම්, හාමුදුරුවෝ ආරාධනාව පිළිගත්තේ කුමටද?යි'' අසන ලදී. "විනය කියන්නේ කුමක්ද යනු මම දන්නේ නැතුව ඒ කියන්ට බාරගත්තෙමි''යි කීවේය. මෙයින් පසු එම දින සවස **කොර්ණේලිස්**අප්පුහාමිගේ නිවසේදී මෙහි යටකී **ඩී.ඒ.ඩී.සිල්වා** උන්නැහෙගේ ඇසීමකට, ගොරකදූවේ **අත්ථදස්සි**තෙරුන්නාන්සේ විසින් "විනය ගිහින්ට කියාදීමට කිසිතැනක තහනමක්නැත'' කියනලදී. යටකී **අනුනායක**තෙරුන්නාන්සේද, සූරියගොඩ **සොනුත්තර** තෙරුන්නාන්සේද මෙකී **අත්ථදස්සි**තෙරුන්නාන්සේද "විනය ගිහින්ට කියාදීමට තහනමක්නැතැයිද'' **හික්කඩුවේනායක**ස්ථවිරයන්වහන්සේ ඒ තහනම්යයිද ප්‍රකාශකළ බැවින් දායකවරුන්ට එහි ඇතිරහස කුමක්දැ?යි දැනගන්ට ඕනෑ විය, එහෙයින් විනය අපට්වජනායයි දෙශනාකරණ

**රාමඤ්ඤනිකායික භික්ෂුසඞ්ඝයා**වහන්සේට පින්කමකෙරීමට බාරදීම පිණිස දායකවරුන් විසින් නියමකර ගන්නාලද්දේය.

එයින්පසු දායකවරු යාලගම ජයසුමානාරාමධිවාසී ගණාචාර්‍ය්‍ය සං. ව. ර. **සිරිසුමනතිස්ස**ස්ථවිරයන්වහන්සේකරා පැමිණ යටකී කාරුණුවිශෙෂයෙන් ප්‍රකාශකොට තම ආරාධනාව අභිමතවූ පරිද්දෙන් කළෝය. ඒ එසේ පිළිගත් **සිරිසුමනතිස්ස**ස්ථවිරයන්වහන්සේ ප්‍රධානකොට ඇති භික්ෂූන්වහන්සේලා විසිපස් නමක් පමණ, මැයිමස 25 වෙනිදින අතුරුවැල්ලේ අභිනවධම්මශාලාවට වැඩමවා පින්කම පුරා ඒ පළමුවෙනි සතියෙහි විනයබණ දෙශනාකරන්ට පටන්ගත්තෝය. ඒ ඇසීමට අසල්ගම්වාසීහු පැමිණෙන්ටවූකල්හි, ඔවුන්ගේ පැමිණීම ස්‍යාමනිකායික භික්ෂූන් සහ එමදායකවරුන් විසින් නවත්වන්ට බොහෝ උත්සාහ කරණ ලද්දේය. ඒ නොහැකිව ඔවුහු මහත් කැලඹීමකට පත්වවිනය දෙශනා කෙරීම කෙසේ නවත්වමුදැයි, කල්පනාකොට **සිජ්කඩුවේනායක**ස්ථවිරයන්වහන්සේකරාගොස්, "විනය පටිච්ඡන්නය" යන අදහස්වලින්යුත් ලියුමක් ලබාගත්තෝය. *

ඒ රුගෙණ ගුරුකන්දේ පූචිසිඤ්ඤෙඅප්පුහාමි ආදී ස්‍යාමනිකායපක්ෂයේ දායකවරු පනස්දෙනෙක් පමණ, මැයිමස 29 වෙනිදින පින්කම කරණ ස්ථානයට පැමිණ එහිදායකවරුන් සමග මෙසේ කීවේය. "අනුපසම්පන්නයන්ට සියලුම විනයපිටකය පටිච්ඡන්නය,ඒ හෙයින්ඔවුන්ට ඒ කියාදීම වරදය'සි මිලින්දප්‍රශ්නයෙහි ප්‍රකාශවතිබෙත්ය"යනුයි. එවිට මෙම පින්කමේ දායකවරුන්විසින් ඔයකී කාරණය එසේ ප්‍රකාශව තිබෙන්නාක්මෙන්ම "තථාගතයන්වහන්සේගේ ධම්මවිනය විවෘතය, වැසීමක්නැත"යනුද එම පොතේ එම පත්ඉරුවේම ප්‍රකාශවතිබෙනවා නොවේදැ?යි අසනලද්දේය. එසේද කියාතිබෙත්යයි, ස්‍යාමනිකායික දායකවරු කීවෝය. එකල්හි, එකිනෙකට පූර්වාපරවිරොධවූ මේ අදහස්ප්‍රකාශවන පාඨදෙක සර්වඥයන්වහන්සේ විසින් වදාළසේකැයි, මිලින්දප්‍රශ්නයෙහි කියාතිබෙන පමණින් පිළිගැණීම යුතුනොවේයයි පින්කමේ දායකවරුකීවෝය. තවද මේ පාඨදෙක **සඞ්ගායන**

---

* මේ අතරතුරකාලයෙහි "රටේ සමාදානය කඩකෙරීමට හේතුවූ කෝලාහල සහිත පින්කමක් කෙරෙත්ය, එබැවින් ඒ ආණ්ඩුව විසින් නවත්වන්ටය" යනාදී කාරුණු කියා මේ පින්කමට ඊර්ෂ්‍යාකළ අයගේ අනුමතයපිට කව්දෝ කෙනෙක් විසින් බලපිටියේ පොලිස් නඩුකාරතුමාට සහ ගාල්ලේ මහඒජන්තතුමාටත් පෙත්සම් දෙකක් දෙනලදී. එතුමන් විසින් ඒ පෙත්සම්දෙක බෙන්තර වලල්ලාවිටිකෝරලේ මුදලිතුමාවෙත එවනලදින් මුදලිතුමා පින්කම්පලට පැමිණ දායකවරුන්ගෙන් ඒ සඳහා කාරුණු අසනලදවිය.

ත්‍රසටනැගුණ බුඩදෙශනාව අනනගීත පොත්හි තිබේදයනු අප දෙපක්‍ෂය විසින් ස්‍යාම, රාමඤ්ඤ යන දෙනිකායික භික්‍ෂුසඞ්ඝයාලවා සොයවා පෙන්විය යුතුයයිකිවෝය. ඊටසතමනිකාය පක්‍ෂයෙහි දායකවරු එකඟවී මීට අනතුරුව දක්වන වාසග මෙත්පූත් ලියුමේ පිටපත් දෙකක් ලියවා අත්සන් තබා දෙපක්‍ෂය අතර ගණු දෙනු කරගන්ට යෙදුනාඇත.

"ශ්‍රීබුඩ වර්‍ෂ යෙන් 2436 වෙනි වර්‍ෂයෙහි පො
සොන්මස පූරජලවස්ලත් ඊව්දින,අතුරුවැල්
ලේ වලව්වේවත්තේ පින්කම්පලේදිය."

මෙහි පහත අත්සන්කරණ දෙන් කරෝලිස්දඅල්විස් සමරදිවාකර ජයසූන්දර, දෙන් නිකුලස්දසිල්වා කරුණාරත්න බෙන්තොට වලල්ලාවිටිකොරලේ කුම්ස්තෝරුආරච්චිද, දෙන් ජෝන්දඅල්විස් සමරදිවාකර ජයසූන්දර ඉදුරුවේ වැඩබලනවිදානආරච්චිද,වටවලගේ දෙන් අගෝනිස් වඩුරාලද,දෙන් හෙන්ද්‍රික් ද සිල්වා ඉදුරුවෙ සකූල්මාස්ටර්ද යන අපවිසින්

"පාතිමොක්ඛුද්දෙසො කෙවලං ච විනයපිටකං පිහිතං පටිච්ඡනානං" යනමේ පාඨය, බුඩදෙශනාවේ අසවල්පොතේ අසවල්තැන තිබෙනවායයි පෙන්වීමටද, බෙන්ඩරගේ දෙන් කොර්ණේලිස්අප්පු, වැරනියගොඩගේ දෙන් අන්ද්‍රිස්දසිල්වා, පානදූරේ පී. ඒ. පීරිස්, දෙන් අමාරිස්දසිල්වා ගුණසේකරපොලිස්මුලාදෑනියා, රණසිංහආරච්චිගේ දෙන් සාමෙල්අප්පු යන අපවිසින්

"තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නොපටිච්ඡන්නො" යනමේ පාඨය බුඩදෙශනාවේ අසවල් පොතේ අසවල්තැන තිබෙනාවායයි පෙන්වීමටද පොරොන්දුවී අත්සන්තබා දෙපක්‍ෂය අතර පිටපත්තබා ගන්ට යෙදුනාඇත.

එන පසලොස්වක පෝයෙන් මෙපිටදිනක මෙම ලියමනේ සඳහන්වූ කාරණා අපදෙපක්‍ෂය විසින් පෙන්නුම් කරණ හැටිය ද පොරොන්දු වූනාඇත.

(අත්සන) දෙන් කරෝලිස්.
( " ) දෙන් නිකුලස්.
( " ) දෙන් ජෝන්දඅල්විස්.
( " ) අගෝනිස්.
( " ) D. H. D. Silva.
( " ) කොර්ණේලිස්.
( " ) D. A. D. Silva.
( " ) P. A. Peiris.
( " ) දෙන් අමාරිස්.
( " ) දෙන් සාමියෙල්.

මේ විවාදාරම්භ ලියුමේ අත්සන්කළ දෙපක්ෂයේ දායකවරුන් විසින් ත්‍රිපිටක ධම්මයට අනනුගත පොත්වලින් පෙන්වීමට පොරොන්දුවනලද ඒ පාඨදෙක "එක පසලොස්වකපෝයෙන් මෙපිට දිනක"පෙන්නුම්කරණවායයි නියමකරගත් පමණවිනා, ඊට ස්ථිරවශයෙන් ඒඅතරදිනයක් නියමකරනොගත්තාලද්දේ.එහෙයින් රාමඤ්ඤනිකායපක්ෂයෙහි දායකවරුන් විසින් එවලේමස්ථිරවශයෙන් දිනයක් නියමකරන්ට ඕනෑය කියනලද්දේය. නමුත් ශ්‍යාමනිකාය පක්ෂයෙහි දායකවරුන්ට ඒ වේලාවෙහි දිනයක්නියමකරන්ට නොහැකි කාරුණ්‍යකියා, විවාදාරම්භ ලියුමලියවා අත්සන් තැබූදිනට පසුදින (මැයිමස 30 වෙනි සඳුදින)සවස 6යට ප්‍රථමයෙන් පැමිණ දැනුම්දෙන්නෙමුය කියා ඔඩ්ඩු ගියෝය. ඒ කියාගිය පරිද්දෙන් නොපැමිණ වැඩිපුරත් දවස්පහක් ගතකළ හෙයින්, මීට අනතුරුව දක්වන ලියුමේ පිටපතක් **කොර්ණේලිස්** අප්පුහාමි අත්සන්කර යැවූයේය.

මෙත්සිත් පෙරටුව ලියා දැනුම් දෙනවගනම්,
ගුරුකන්දේ **දෙන් කොර්ණේලිස්ද අල්විස්** සමරදිවාකර
ජයසුන්දරඅප්පුහාමි වෙතටයි.

භවතානනි,

මෙහි පහත අත්සන්කරණ මම ඇතුළුව පස්දෙනෙක් සහ තමුන්නාන්සේ ඇතුළුව පස්දෙනෙක්ද අතරේ පසුගිය මස 29 වෙනිදින, අතුරුවැල්ලේ පිත්කම්පලේදී ගණුදෙනුකරගත්ට යෙදුන එකම වාසගමෙන් යුත්ලියුම්දෙකේ සඳහන් කරණලද කාරණ අතුරෙන් "පාතිමොක්ඛුද්දෙසො කෙවලංච විනය පිටකං පිහිතංපටිච්ඡන්නං"යි යන පාඨය තමුන්නාන්සේලාවිසින් ද; "තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නොපටිච්ඡන්නො"යි යන පාඨය අපවිසින්ද, සූත්‍රාභිධර්මවිනයසඞ්ඛ්‍යාත පිටකත්‍රයෙන්(ශ්‍රීබුද්ධදේශනාපාලියෙන්)පෙන්වාදීම පිණිස ගිවිසගෙණ "ඒ අසවල් දින මෙන්දී පෙන්වාදෙන්නෙමු"යි ස්ථිරලෙස අපපක්ෂයෙන් දිනයක් නියමකරන්ට යොජනාකලවිට තමුන්නාන්සේලාට ; ඒ වේලාවේදී දිනයක් නියමකරන්ට නුපුළුවනකියා, ඊටපසු දින පස්වරුහයට (පසුගිය මස 30 වෙනි සඳුදා පස්වරු හයට) මත්තෙන් අපට දැනුම් දෙන්නෙමුයි කී නමුත් අදදක්වා ඒ අපට දැනුම්නොදී විසීමට ඇතිහෙතුව කුමක්දැයි නොදනිමු.

මේ බවට, යව්දිව් හිත සැප කැමති
(අත්සන) "**කොර්ණේලිස්**"

**වර්ෂ 1892 ක්‍රි ජූනි මස 5** වෙනි දින,
අතුරුවැල්ලේ පිත්කම් පලේදීය.

## ඡවලැබුනු පිළිතුරු ලියුම

"දයානුසම්මෘති පෙරටුකොට ලියාඑවන වගනම්,

පසුගිය මස 29 වෙනිදින අතුරුවැල්ලේ පිත්කම් පලේදී විනයධම්මය පැවැත්වූ සතියේදී මිස පිරිත්දෙශනාව පවත්වන මේ සතියේදී ගිහින්ට ශ්‍රමණ විනය කියාදීමගැණ වාදයකට අපි බැඳීනැත්තෙමුයි තමුසේලා අපදෙපක්ෂය ඉදිරියේ කළකථාව නිසා මට පළමු තමුසේ ඇතුළුවූ පස්දෙනෙක් සමග මා ඇතුළුවූ පස්දෙනෙක් විසින් ගිවිසගත් පොරොන්දුව අත්හැරිගිය බව මෙසින් මතක් කරණවත්ඇර, භික්ෂූන්ට පැණවූ ශික්ෂාපද ප්‍රඥප්ති සාමාන්‍ය ගිහිසමූහයාට කියාදීමු වරදබව පෙන්වීම පිණිස අද සඳුදා දවල් එකෙක්කනිසමට ප්‍රසිද්ධ දෙශනාවක් යාලගම සුනන්දාරාම විහාරස්ථානයේදී පවත්වන බැවින්. ඒ පිළබඳව කාරුණ්‍ය දැනගණු කැමතිනම් එමස්ථානයට පැමිණෙනලෙසද මෙසින් මතක් කරමි.

මේවගට,

දොන් කරෙලිස්දඅල්විස් සමරදිවාකර ජයසුන්දර

(අත්සන) "**දොන් කරෝලිස්**"

වර්ෂ 1892 ක්‍රි ජූන්මස 6 වෙනි දිනදීය.

යටදැක්වූ ලියුමෙහි "තමුසේ ඇතුළුව පස්දෙනෙක් සමග මා ඇතුළුව පස්දෙනෙක් විසින් ගිවිසගත් පොරොන්දුව අත්හැරිගිය බව මෙසින් මතක්කරණව" යනු **කරොලිස්දඅල්විස්**......අප්පුහාමි විසින් ලියනලද්දේ සිහියෙන් යුක්තවයයි නොසිතමු. ඒ මක්නිසාදයත්? දෙපක්ෂයෙහි දායකවරුන්දසදෙනා විසින් ගිවිසගණ අත්සන්කරණලද විවාදාරම්භ ලියුමේ "එනපසලොස්වක පෝයෙන් මෙපිට **දිනක** මෙම ලියමනේ සඳහන්වූකාරණා අපදෙපක්ෂය විසින් පෙන්නුම් කරණහැටියටද පොරොන්දුවූනාඇත" යනු ලියාතිබෙනබැවිනි. විවාදාරම්භලියුමේ සඳහන්කළ පසලොස්වක පෝයනම්:—මෙම වර්ෂයෙහි මැයිමස 10 වෙනි කුජදින පෑත්වූ 52 වෙනි පෑ විනාඩි 40 න් ලබා 11 වෙනි බුදදින 57 වෙනි පෑ විනාඩි 12 න් ගෙවුනාවූ(පොසොන්මස පසලොස්වක)පෝයවේ **කරෝලිස්දඅල්විස්**......අප්පුහාමි විසින් යථොක්ත ලියුමලියනලද්දේ මැයිමස 6 වෙනි දිනදීය, එදින සිට දිනහතරක් ඉක්මීමෙන් පසලොස්වක පෝයදින පැමිණෙන්ට තිබුනුබවපෙණේ. එසේ තිබියදී පොරොන්දු අත්හැරිගියායයි,විවාදයට නොපැමිණි ප්‍රයෝගයෙන් මගහරිණ. අදනසින් යුක්තව ඒ ලියුම එව්වේ "පාතිමොක්ඛුද්දෙසො කෙවලංච විනයපිටකං පිහිතංපටිච්ඡන්නං" යන පාඨයදෙශනා පොතකින් පෙන්වන්ට නුපුළුවන් බැවින්වාටසැකනෑ.

ශෛදපක්ෂයෙහි දායකවරුන් විසින් ගණුදෙනු කරගත්තාලද විවාදාරම්භලියුමේ අන්දමට ශ්‍යාමනිකායපක්ෂයෙහි දායකවරුන්ට ජයනැති බැවින්, අන්‍යක්‍රමයකට මේ විවාදය ගොඩනගණ අදහසින්යුක්තව කාසිකාවල රේවතතෙරුන්නාන්සේ විසින් හිරිසුමන තිස්සතෙරුන්නාන්සේට එවනලදලියුම් සහ ඊට යවනලද පිළිතුරුලියුම්ද මීට අනතුරුව දක්වනුලැබේ.

“මෙත්සිත් පෙරදැරිව ලියමි”

දැනට අතුරුවැල්ලේ පිත්කම්පලේ පො
රොත්තුව ඉන්නයාලගම සුමනතිෂ්‍ය
ස්ථවිරාදීන්ට දන්වාඑවන වගනම්.

සර්වඥයන්වහන්සේ විසින් භික්ෂූන්ට පණවාවදාළ ශික්ෂාපද ප්‍රඥප්ති තමුන්නාන්සේලා විසින් සාමාන්‍ය ගෘහස්ථජනයාට කියන බව සැලයි, ඒ සැබෑනම් එලෙසකීමට සර්වඥයන්වහන්සේගේ අනුදැනීමක් තිබේද, මීට පමානැතුව උත්තර එවනුමැනවි.

මේබව ලියාඑව්වේ.
කාසිකාවල සුනන්දාරාම විහාරාධිවාසී
රේවත ස්ථවිරයෝ.

(අත්සන)—“රේවත”

වර්ෂ 1892 ක්වූ ජූනි මස 1 වෙනි
දින කාසිකාවලදීය.

## මේ ලියුමට යවනලද පිළිතුරු.

මෙත්සිත් පෙරටුව ලියා දැනුම්දෙමි.
කාසිකාවල සුනන්දාරාම විහාරාධිවාසී
රේවත ස්ථවිරයන් වෙතටයි.

තමුන්නාන්සේ විසින් මේමස 1 වෙනි දින දාතමින් මාවෙත එවනලද ලියුමලැබී කියවාගත් නමුත් එවලේම උත්තර ලියාඑවීමට අවකාශ නොතිබුනබැවින් ඒසඳහා කියයුතුකරුණු ලියුම ගෙණ ආ පූචිසිඤ්ඤො අප්පුහාමි සමග කීවෙමි, තවත් ඊට උත්තරවශයෙන් මෙසේද ලියමි.

තමුන්නාන්සේගේ ලියුමෙහි “සර්වඥයන්වහන්සේ විසින් භික්ෂූන්ට පණවාවදාළ ශික්ෂාපද ප්‍රඥප්ති තමුන්නාන්සේලා විසින් සාමාන්‍යගෘහස්ථජනයාට කියනබව සැලයි, ඒ සැබෑනම් එලෙසකීමට සර්වඥයන්වහන්සේගේ අනුදැනීමක් තිබේද?” යනු අසාතිබේ, විනයපටිච්ඡන්නා පටිච්ඡන්නතාවය පිළිබඳව ශ්‍යාමනිකායපක්ෂයෙන් ගුරුකත්දේ පූචිසිඤ්ඤො අප්පුහාමි ආදි පස්

දෙනෙක් සහ රාමඤ්ඤ නිකායපක්ෂයෙන් අතුරුවැල්ලේ කොර් ණේලිස් අප්පු ආදී පස්දෙනෙක්ද අත්සත්කොට පසුගිය මස 29 දින ලියුම්දෙකක් ගණුදෙනු කරගණ විවාදයක් ආරම්භකර තිබෙනබැවින් ඒ අවසානවූකලක තමුන්නාන්සේගේ දැනගැණීම සඳහා අසා එවාතිබෙන කරුණුවලට පිළිතුරු ලියා එවන්නෙමි.

මේවගට,

යව් දිව් හිත සැපකැමති

යාලගම, සා. ව. ර. සිරිසුමනතිස්සස්ථවිරයෙමි

(අත්සන)—"සා. ව. ර. සිරිසුමනතිස්ස

වර්ෂ 1892 ක්වූ ජුනිමස 5වෙනි දින

අතුරුවැල්ලේදීය.

රේවත තෙරුන්නාන්සේ විසින්

එවනලද දෙවෙනි ලියුම.

මෙත්සිත් පෙරටුව ලියමි.

"වර්ෂ 1892 ක්වූ ජුනිමස 1 වෙනිදින තියමය ඇති ලියමනින් මා විසින් විචාරුළුවූ කරුණට ප්‍රත්‍යුත්තර එවා නැහැ, මතුඑවන බවක් කියාතිබේ, එසේ උත්තර එවනවානම් අද (සඳුදා) දවල් දොළගේ කණ්සම්න් මෙපිට එවන්ට ඕනෑ, මේ ඇර යම් භික්ෂු කෙණෙක් භික්ෂූන්ට පණවාවදාළ ශික්ෂාපද ප්‍රඥප්ති සාමාන්‍ය ගිහිජනයාට කියාදෙනවානම් බුඩනියමයවූ පරිද්දෙන් ඒ වරදබව වැඩිදුරටත් කියමි.

මේවගට,

කයිකාවල සුනනෑරම විහාරාධිවාසී

රේවත ස්ථවිරයෝය.

(අත්සන)—"රේවත"

1892 ක්වූ ජුනි මස 6

වෙනි දින දීය.

ඊට යවනලද පිළිතුරු ලියුම.

"මෙත්සිත් පෙරටුව ලියමි"

තමුන්නාන්සේ විසින් මේ මය 6 වෙනි දින එවනලද ලියුම් ලැබුණා, එහි මේ මස 1 වෙනි දින මා නමට එවූලියුමට පිළිතුරු එවා නැතකියා තිබුනේ වී නමුත් ඊට (එකල) දියයුතු උත්තර මේ මස 5 වෙනිදින ලියාඑවාඇත.

"මේ ඇර යම් කිසි භික්ෂුකෙණෙක් භික්ෂූන්ට පණවා වදාළ ශික්ෂාපද ප්‍රඥප්ති සාමාන්‍ය ගිහිජනයාට කියාදෙනවානම්, බුඩ

නියමයවූ පරිද්දෙන් ඒ වරදබව වැඩිදුරටත් කියමි"යි කියාතිබේ. කොපමණ දුරටකීවත් විනය පටිච්ඡන්නය සඳහා වදාළාය කියන **පාඨය ත්‍රිපිටකයට අන්තර්ගත** පොතකින් පෙන්වනතුරු භාරගන්නේ කව්ද ? තමුන්නාන්සේලා ඇත්ත සූත්‍ර ලොකයාට පෙන්වාදෙන කාරුණ්‍යාධ්‍යාශයකින් යුක්තව ක්‍රියාකරන්නෝනම් විනය පටිච්ඡන්නායයි වදාළාවූ දෙශනා පාඨාදියක් ඇත්නම් ඒ සෑහුවම නොපෙන්වන්ට තිබෙනයුතුකම කුමක්ද? මේ විනය පටිච්ඡන්න අපටිච්ඡන්නායෙහි තීන්දුවක් ලබාගැණීම ප්‍රසිද්ධ පණ්ඩිතයන්ගෙන්පවා අමාරුවී තිබෙනබව පැහැදිලිව ප්‍රකාශවේ.

මේබවට,

යව්දිව් හිතසැපකැමති

යාලගම, සා. ව. ර. සිරිසුමනතිස්සස්ථවිරයෝමි.

(අත්සන)"**සා. ව. ර. සිරිසුමනතිස්ස.**"

වර්ෂ **1892** ක්වූ ජූනිමස **6** වෙනිදින

අතුරුවැල්ලේදීය.

මේ විවාදය පිළිබඳවූ ලියුම් මෙපණකින් නිමියේය. එහෙසින් මෙතැන්සිට, සර්වඥයන්වහන්සේ විසින් වදාරණ ලද **විනය ධර්මය** අපටිච්ඡන්න බවටහා ඒ දැනගන්ට කැමති සාමණේරඋපාසකාදීන්ට කියාදීමට තහනමක් නැතිබවටත් දෙශනාඅර්ථකථාදියෙන් මදක් කරුණුගෙණහැර දක්වනුලැබේ.

---

**"නමොතස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස."**

**අඟුත්තරසඟියේ තිකනිපාතයේ භරණ්ඩුවර්ගයෙහි—**

තථාගතප්පවෙදිතො භික්ඛවෙ ධම්මවිනයො විවටො විරොචති නොපටිච්ඡන්නො—භාවය—මහණෙනි, තථාගතයන්වහන්සේ විසින් ප්‍රතිවෙධ කරණලද ධම්මවිනය තෙම විවෘතවූයේ බබලයි, ප්‍රතිච්ඡන්නනොවූයේය.

**තදට්ඨකථාවෙහි**-

විවටො විරොචතීති එත්ථ එකතො උභතො අනන්තතො සබ්බත්ථතොති චතුබ්බිධා විවටතා වෙදිතබ්බා තත්ථ එකතො විවටංනාම අසාධාරණ සික්ඛාපදං, උභතො විවටංනාම සාධාරණ සික්ඛාපදං, අනන්තතො විවටංනාම පටිලද්ධ ධම්මගුණං, සබ්බත්ථ විවටංනාම තෙපිටකං බුද්ධවචනං—භාවය—(දෙශනාවෙහි) විවටො විරොචතියනවචන විෂයෙහි එක්පසකින්ද, දෙපසින්ද, නමන්ගේ වශයෙන්ද, සියලු ස්ථානවශයෙන්දැයි, සතරකාරයකින් විවෘතබව දතයුත්තීය. එහි එක්පසෙකින් විවෘතයනම්—අසාධාරණ (හෙවත් භික්ෂු භික්ෂුනී දෙපක්ෂයෙන් අනික්පක්ෂයට සාධාරණ

නොවන) ශික්ෂාපදයයි. දෙපසින් විවෘතයනම්—සාධාරණ (හෙවත් භික්ෂුභික්ෂුනීදෙපක්ෂය විසින් සමවහික්මියයුතු)ශික්ෂාපදයයි. තමන්ගේ වශයෙන් විවෘතයනම්—අධිගතධම්මගුණයයි. **සියලු ස්ථාන**වශයෙන්විවෘතයනම්—ත්‍රිපිටකබුද්ධ වචනයයි.

මෙහිගෘහස්ථ ප්‍රව්‍රජිත ආදී කිසිම තැනක් අත්නොහැරිබව "**සබ්බඤ්ඤුනො**" යන වචනයෙන්ද; විනයපිටකය අත්නොහැරිබව"**තෙපිටකං බුද්ධවචනං**" යන්නෙන්ද නිශ්චිතයි.

**පරිවාරපාළියෙහි—**

තීනි විවටානි විරොචන්ති නොපටිච්ඡන්නානි චන්දමණ්ඩලං විවටං විරොචති නොපටිච්ඡන්නං, සූරියමණ්ඩලං විවටං විරොචති නොපටිච්ඡන්නං, තථාගතප්පවෙදිතො ධම්ම විනයො විවටො විරොචති නොපටිච්ඡන්නො—භාවය—ත්‍රිවිධධර්මයෝතුමූ විවෘත වූවාහු බබලත්, ප්‍රතිච්ඡන්නනොවෙත්, චන්ද්‍රමණ්ඩලය විවෘතවූයේ බබලයි, ප්‍රතිච්ඡන්නනොවේ; සූර්‍ය්‍යමණ්ඩලය විවෘතවූයේ බබලයි, ප්‍රතිච්ඡන්නනොවේ. තථාගතයන්වහන්සේ විසින් ප්‍රතිවෙද කරණලද **ධර්මවිනය**තෙම විවෘතවූයේ බබලයි **ප්‍රතිච්ඡන්න** නොවේ.

**තදට්ඨකථාවෙහි—**

චන්දමණ්ඩලං අබ්භ මහිකා ධූම රජෝ රාහු විමුත්තං විවටං යෙව විරොචති නතෙසු අඤ්ඤතරෙන පටිච්ඡන්නං තථා සූරියමණ්ඩලං, ධම්ම විනයොපි විවරිත්වා විභජිත්වා දෙසියමානොව විරොචති නොපටිච්ඡන්නො—භාවය—සඳමඬලතෙම අබ්‍රු (වලාකුල්) පිනි දුම් රජස්රාහු යනමෙයින් මිදුනේ විවෘතවම බබලයි,ඔවුන් අතුරෙන් එක්තරා උපක්ලේශයක් විසින් ප්‍රතිච්ඡන්නවූයේ නොබබලයි. එසේම හිරුමඬලනොබබලයි. ධර්ම **විනය** තෙම **විවෘත** කොට බෙදා **දෙශනා** කරණලද්දේම බබ**ලයි. ප්‍රතිච්ඡන්නනොවූයේය.**

**දික්සඟියේ මහාපරිනිර්වාණ සූත්‍රයේ තුන්වෙනි බණවරෙහි—**

අථ ඛො ආනන්ද මාරො පාපිමා යෙනාහං තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා එකමන්තං අට්ඨාසි. එකමන්තං ඨිතො ඛො ආනන්ද මාරො පාපිමා මං එතදවොච පරිනිබ්බාතු දානි භන්තෙ භගවා පරිනිබ්බාතු සුගතො පරිනිබ්බාන කාලො දානි භන්තෙ භගවතොති එවංවුත්තෙ අහං ආනන්ද මාරංපාපිමං එතදවොචං න තාවාහං පාපිම පරිනිබ්බායිස්සාමි. යාවමෙ භික්ඛූ න සාවකා භවිස්සන්ති වියත්තා විනීතා විසාරදා බහුස්සුතා ධම්මධරා විනයධරා ධම්මානුධම්මපටිපන්නා සාමීචිප්පටිපන්නා අනුධම්මචාරිනො

සකං ආචරියකං උග්ගහෙත්වා ආචික්ඛිස්සන්ති දෙසෙස්සන්ති පඤ්ඤපෙස්සන්ති පට්ඨපෙස්සන්ති විවරිස්සන්ති විභජිස්සන්ති උත්තානීකරිස්සන්ති උප්පන්නං පරප්පවාදං සහධම්මෙන සුනිග්ගහීතං නිග්ගහෙත්වා සප්පාටිහාරියං ධම්මං දෙසෙස්සන්ති යාවමෙ භික්ඛුනියො න සාවිකා භවිස්සන්ති වියත්තා—පෙ—යාවමෙ උපාසකා න සාවකා භවිස්සන්ති වියත්තා—පෙ—යාවමෙ උපාසිකා න සාවිකා භවිස්සන්ති වියත්තා—පෙ—භාවය—ඉක්බිත්තෙන් ආනන්දය පවිටුවූ මාරතෙම මම යම්තැනෙක්හිද එතැන්හි එළඹියේය (මාකරා) එළඹ එකත් පසෙක්හි සිටියේය. ආනන්දය එකත් පසෙක්හි සිටියාවූ පවිටු මාරතෙම මට මෙසේ කීයේය. ස්වාමිනි භාග්‍යවත්තෙමේ පිරිනිවන්පානාසේක්වා, සුගතතෙමේ (දැන්) පිරිනිවන්පානාසේක්වා, ස්වාමිනි භාග්‍යවතුන්වහන්සේගේ දැන් පිරිනිවන්පෑමට කල්වන්නේයයි (යාච්ඤාකළේය) මෙසේ කී කල්හි ආනන්දය මම පවිටුවූ ඒ මාරයාහට මෙසේකීයෙමි, එම්බා පවිටුවූ මාරය! යම්තාක්කල්මාගේ භික්ෂූහු ශ්‍රාවකනොවන්නාහුවෙද්ද, ව්‍යක්තනොවන්නාහුවෙත්ද, භික්මුනාහුනොවෙද්ද, විශාරදනොවන්නාහුවෙද්ද, බහුශ්‍රැතනොවන්නාහුවෙද්ද, ධර්මධරනොවන්නාහුවෙද්ද, විනයධරනොවන්නාහුවෙද්ද, ධර්මානුධර්මයෙහි පිළිපන්නාහු නොවෙද්ද, සාමීචිකර්මයටයොග්‍යව පිළිපන්නාහු නොවෙද්ද, අනුධර්මචාරීනුවාහුවෙද්ද, ස්වකීය ආචාර්යවාද ඉගෙණ නොකියන්නාහුවෙද්ද, දෙශනානොකරන්නාහුවෙද්ද, නොපෙන්වන්නාහු වෙද්ද, පිහිටුවානබන්නාහුනොවෙද්ද, විවෘතකොට දක්වන්නාහු නොවෙද්ද, විභාගනොකරන්නාහුවෙද්ද, (ගාම්භීරාර්ථයන්) උත්තාන නොකරන්නාහුවෙද්ද, උපන්නාවූ අන්‍යදෘෂ්ටිකවාදයන් සහ ධාර්මිකවචනායෙකාට නිග්‍රහකරණලද්දුව නෛර්‍යාණිකකොට ධර්මදෙශනා නොකරන්නාහුවෙද්ද, මාරය! ඒ තාක් මම පිරිනිවන්නොපාන්නෙම්යි වදාළේය. යම්තාක්කල් මාගේ භික්ෂුනීහු ශ්‍රාවිකානොවන්නාහුවෙද්ද, ව්‍යක්තනොවන්නාහු වෙද්ද—පෙ—යම්තාක් කල්මාගේ උපාසකයෝ ශ්‍රාවකනොවන්නාහු වෙද්ද, ව්‍යක්තනොවන්නාහුවෙද්ද—පෙ—යම්තාක් කල්මාගේ උපාසිකාවෝ ශ්‍රාවිකාහු නොවන්නාහුවෙද්ද, ව්‍යක්තනොවන්නාහුවෙද්ද—පෙ—

මේ දෙශනාවෙන්, සර්වඥයන්වහන්සේගේ ශාසනයෙහි භික්ෂු භික්ෂුනී යන උභයපාක්ෂිකය පමණක්නොව, **උපාසක උපාසිකා යන ගිහි** උභයපාක්ෂිකයන් **ධර්මධර විනයධර** වනතුරු සර්වඥයන්වහන්සේ පිරිනිවන්නොපානබැව් මාරයාහට වදාළේය යනු සුවසේ ප්‍රකාශවේ.

**සමන්ත පාසාදිකා දුර්වචශික්‍ෂාපද වර්ණනාවෙහි—**

සඟධම්මිකං වුච්චමානො ති සහධම්මිකෙන වුච්චමානො කරණත්ථෙ උපයොගවචනං පචනි සහධම්මිකෙහි සිකඛි තබබ තතා තෙසං වාසනතකතතා සඟධම්මිකං තිලබ්ධනාමෙන බුඩ පඤ්ඤතෙතන සිකඛාපදෙන වුච්චමානොති අත්ථො—භාවය—(පෙලෙහි) "සහධම්මිකංවුච්චමානො" යනු සහධාර්මිකශික්‍ෂාපදයකින් කියනුලබන්නේයි කරණාර්ථයෙහි කර්මවිභක්තියි, සහ ධාර්මිකයන් පස්දෙනා විසින් හික්මියයුතු බැවින් නොහොත් ඔවුන් සන්තක බැවින් සහධාර්මිකයයි ලබනලද නම්ඇත්තාවූ බුදුන් විසින් පණවනලද ශික්‍ෂාපදයකින් කියනු ලබන්නේය යන අර්ථයි.

**විමතිවිනොදනී මහා ඛන්ධක වර්ණනාවෙහි—**

ආභිසමාචාරිකෙසුපි විනෙ තබ්බොති ඉමිනා සෙඛියවත්ත ඛන්ධක වත්තෙසු අඤ්ඤෙසුච සුරාපාන විසසට්ඨි ආදී ලොක වජ්ජ සිකඛාපදෙසුච සාමණෙරෙහි වත්තිතබ්බං, තත්ථපන අවත්තමානො අලජ්ජී දණ්ඩ කම්මා රහොච හොතීති දසෙසති—භාවය—(විනයඅටුවාවෙහිඅ) "ආභිසමාචාරිකෙසුපිවිනෙතබ්බො" යන මෙවචනයෙන් සෙඛියාවත්, කඳුවත් යන මෙහිද, සෙසුසුරාපාන විසසට්ඨිආදිලොකවද්‍ය ශික්‍ෂාපදයන්හිද සාමණේරයන් විසින් හික්මියුත්තේය. එහිවනාහි නොහික්මෙන්නාවූ අලජ්ජීසාමණේර තෙම(දඬු)දඬුවම් ආදියට සුදුසුවේයයි දක්වයි.

මේ ආදී නොයෙක්තන්හි,සාමණේරවරයන් විනය ප්‍රඥප්ති විෂයෙහි හික්මවියයුතුබව ප්‍රකාශවතිබෙද්දී "අනුපසම්පන්නයන්ට විනය කියාදීම තහනම්ය" කියන භික්‍ෂූහු, සාමණේරවරුන්ට **විනය** කියානොදෙන්නම් ඒකාන්ත අලජ්ජීත්වන බවද, එම සාමණේරවරයින්හුත් දිනපතා අප්‍රමාණවතනභෙදකාදියෙන් වරදට පැමිණ නියත අලජ්ජීත්වනබවද ඉතා පැහැදිලියි.

**කුදුගොන්සඟියේ සූත්‍රනිපාත අටුවාවෙහි—**

තිට්ඨමානෙක්ර භගවති ලොකනාථෙ ධම්මිකොනාම උපාසකො අහොසි, නාමෙනච පටිපත්තියාච, සොකිර සරණසම්පන්නො සීලසම්පන්නො බහුස්සුතො පිටකත්තයධරො අනාගාමි අභිඤ්ඤාලාභී ආකාසචාරී අහොසි, තස්ස පරිවාරා පඤ්චසත උපාසකා තෙපි තාදිසා යෙව අහෙසුං—භාවය—ලොකස්වාමිවූ භාග්‍යවතුන්වහන්සේ ජීවමාන කාලයෙහි නමින්ද ප්‍රතිපත්තියෙන්ද ධාර්මිකවූ (එක්තරා) **උපාසකයෙක්**වූයේය, හෙතෙමවනාහි සරණයෙන් සමන්විතය, ශීලයෙන් සමන්විතය, බහුශ්‍රැතය,

(සූත්‍රාභිධම්මවිනය යන) **ත්‍රිපිටකධාරිය**, අනාගාමිය, (පංච) අභිඥාලාභිය, අවකාශයෙහි හැසිරෙණ සුළුදවිය. ඔහුගේ පිරිවර **පන්සියයක් උපාසකයෝ**වූහ, ඒ උපාසකයෝතුමූද මෙබඳුගුණයෙන් සමන්විතවූහ.

මෙසින්, **ධම්මික** උපාසකතුමා ප්‍රධානකොටඇති පන්සියයක් පිරිස(විනයපිටකයත් ඇතුලත්වූ)**ත්‍රිපිටකධාරීව** විසූබව ප්‍රත්‍යක්ෂවන්නාක්මෙන්, **ජන්තපානි** උපාසකාදීහූද ත්‍රිපිටකධාරීව විසූබව දම්පියාඅටුවාආදී පොත්හි ප්‍රකාශවතිබේ.

**ධම්මපදට්ඨකථාවෙහි**

සා සත්ථු සන්තිකං ගන්ත්වා දෙසිතං දෙසිතං ධම්මං සුත්වා අම්හාකං කථෙන්තීති වදිංසු, තථා කරොන්තී අපරභාගෙ තෙපිටකධරා ජාතා—භාවය—ශාස්තෘන්වහන්සේගේ සමීපයටගොස් දෙසූදෙසූ ධර්මයඅසා අපට කියව්යි කීවාහුය, ඈ එසේ කරන්නී මෑතභාගයෙහි **ත්‍රිපිටකධරවූ**වාය.

**ඛුජ්ජුත්තරා**නම් උපාසිකාතොමෝද ත්‍රිපිටකධාරීව විසීයයි මෙසින්පෙණීයන්නාක් මෙම්ම **නන්දමාතා** උපාසිකාදීහුද ත්‍රිපිටකධාරීව විසූබව දම්පියාඅටුවාවෙහි ප්‍රකාශයි.

**සමන්තපාසාදිකාවෙහි—**

ථෙරං පුච්ඡි පතිට්ඨිතං නුඛො භන්තෙ තම්බපණ්ණිදීපෙ සාසනන්ති? පතිට්ඨිතං මහාරාජ සාසනං මූලානි පනස්ස න තාව ඔතරන්තීති, කදා පන භන්තෙ මූලානි ඔතිණ්ණානි නාම භවිස්සන්තීති, යදා මහාරාජ තම්බපණ්ණිදීපකානං මාතාපිතූනං තම්බපණ්ණිදීපෙ ජාතො දාරකො තම්බපණ්ණිදීපෙ පබ්බජිත්වා තම්බපණ්ණිදීපම්හියෙව විනයං උග්ගහෙත්වා තම්බපණ්ණිදීපෙ වාචෙස්සති තදා සාසනස්ස මූලානි ඔතිණ්ණානි නාම භවිස්සති, අත්ථිපන භන්තෙ එදිසො භික්ඛූති? අත්ථි මහාරාජ! මහාඅරිට්ඨො භික්ඛු පටිබලො එතස්මිං කම්මෙති. මයා එත්ථ භන්තෙ කිං කාතබ්බන්ති? මණ්ඩපං මහාරාජ! කාතුං වට්ටතීති. සාධු භන්තෙති රාජා මෙඝවණ්ණාභයස්ස අමච්චස්ස පරිවෙණට්ඨානෙ මහාසඞ්ගීතිකාලෙ අජාතසත්තු මහාරාජෙන කතමණ්ඩපප්පකාරං රාජානුභාවෙන මණ්ඩපං කාරෙත්වා සබ්බතාලාවචරෙ සක සක සිප්පෙ පයොජෙත්වා සාසනස්ස මූලානි ඔතරන්තානි පස්සිස්සාමීති අනෙක පුරිසසහස්සපරිවුතො ථූපාරාමං අනුප්පත්තො. තෙන ඛො පන සමයෙන ථූපාරාමෙ අට්ඨසට්ඨි භික්ඛුසහස්සානි සන්නිපතිංසු. මහාමහින්දත්ථෙරස්ස ආසනං දක්ඛිණාභිමුඛං පඤ්ඤත්තං හොති. මහාඅරිට්ඨත්ථෙරස්ස ධම්මාසනං උත්තරාභිමුඛං පඤ්ඤත්තං හොති. අථඛො. මහාඅරිට්ඨත්ථෙරො මහාමහින්දත්ථෙරෙන අජ්ඣිට්ඨො අත්තනො

අනුරූපෙන වස්සග්ගක්කමෙන ධම්මාසනෙ නිසීදි. මහාථෙරා ධම්මාසනං පරිවාරෙත්වා නිසීදිංසු. රඤ්ඤොපි කනිට්ඨභාතා මත්තාභයත්ථෙරො නාම ධුරග්ගාහො හුත්වා විනයං ගණ්හිස්සාමීති පඤ්චභික්ඛුසතෙහි සද්ධිං මහාඅරිට්ඨත්ථෙරස්ස ධම්මාසනමෙව පරිවාරෙත්වා නිසීදි. අවසෙසාපි භික්ඛූ සරාජිකා ච සපරිසා අත්තනො අත්තනො පත්තාසනෙ නිසීදිංසු. අථායස්මා මහාඅරිට්ඨත්ථෙරො තෙන සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං විහරති නළෙරුපුචිමන්දමූලෙති විනයනිදානං අභාසි—පෙ—කායකම්ම වචීකම්මවිප්පජ්ජිත විනයං විනයපිටකං පකාසෙසි. පකාසෙත්වා ච යාවතායුකං තිට්ඨමානො බහූනං වාචෙත්වා බහූනං හදයෙ පතිට්ඨපෙත්වා අනුපාදිසෙසාය නිබ්බාණධාතුයා පරිනිබ්බායි-**භාවය**-දෙවෙනි පෑතිස්සරජතෙම ස්වාමීන්වහන්ස! ලඞ්කාද්වීපයෙහි ශාසනයපිහිටියේදැයි? මහාමහෙන්ද්‍රස්ථවිරයන්වහන්සේගෙන් විචාළේය. මහරජ ශාසනය පිහිටියේය, තවම ශාසනයාගේ මුල්බැසගෙනොගත්තාහුය. ස්වාමීනි කවරකලෙක්හි (ශාසනයාගේ) මුල්බැස ගැණීමවන්නාහුද? මහරජ! යම්කලෙක්හි ලක්දිව උපන් මාතෘ පිතෘන්ට දාව උපන් දරුවෙක්තෙම ලක්දිවෙහි පැවිදිව ලක්දිවෙහිම විනය ඉගෙණ ලක්දිවදීම කියවන්නේද, එකල්හී ශාසනයාගේ මූල් බැසගැණීමවන්නාහුය. ස්වාමීන්වහන්ස එබඳුවූ භික්ෂුවක් ඇත්තේදැයි විචාළේය. මහරජ මහාඅරිට්ඨනාම් භික්ෂුවක් ඇත්තේය, මේ කටයුත්තෙහි හෙතෙම දක්ෂවන්නේයයි කියේය. ස්වාමීනි මා විසින් මෙහිකුමක් කටයුතුද? මහරජ මණ්ඩපයක් කරන්ටවටි, රජතෙම ස්වාමීනි යහපතැයි, මෙඝවණ්ණ අභය අමාත්‍යයාගේ පරිවෙණස්ථානයෙහි මහාසඞ්ගායනා කාලයෙහි අජාසත්මහරජ විසින් කරණලද මණ්ඩපයවැනිවූ මණ්ඩපයක් රාජානුභාවයෙන් කරවා සියලු තාලාවචරයන් (සියලු තූර්‍ය්‍යයන් වයන්නාවූ පුරුෂයන්) ස්වකීය ස්වකීය ශිල්පයන්හි යොදවා ශාසනයාගේ මුල්බැස ගැණීම බලන්නෙමියි, නොයෙක් **දහස්ගණන් පුරුෂයන්** විසින් පිරිවරණලදුව ථූපාරාමයකරා පැමිණියේය. එකල වනාහි ථූපාරාමයෙහි හැටඅටදහසක් භික්ෂූහුරැස්වූනාහුය. මහාමහෙන්ද්‍ර ස්ථවිරයන්වහන්සේට ආසනයක් දකුණුදෙසට අභිමුඛව පණවනලද්දේවිය. මහාඅරිට්ඨ ස්ථවිරයන්වහන්සේගේ ධම්මාසනය උතුරුදෙසට අභිමුඛව පණවනලද්දේවිය. ඉක්බිති මහා අරිට්ඨ ස්ථවිරතෙම මහෙන්ද්‍ර ස්ථවිරයන්වහන්සේ විසින් ආරාධනා කරණලද්දේ තමන්වහන්සේට පැමිණි ක්‍රමයෙන්සුදුසුවූ ධම්මාසනයෙහි වැඩඋන්සේක. මහාස්ථවිරයන්වහන්සේලා ධම්මාසනය පිරිවරා වැඩඋන්නාහුය. රජහුගේද මලනු සහෝදරවූ මත්තාභයස්ථවිරතෙම ධුරග්‍රාහිව **විනය** (ඉගෙණ) ගන්නෙමියි පන්සියයක්

භික්ෂූන්සමග මහාඅරිට්ඨස්ථවිරයන්වහන්ගේ ධම්මාසනය පිරිවරා වැඩඋන්නේය. සෙසු භික්ෂූන්වහන්සේලාද **රජසහිතවූපිරිසද** තමතමන්ට පැමිණි ආසනයෙහි උන්නාහුය. ඉක්බිති ආයුෂ්මත් මහාඅරිට්ඨස්ථවිරතෙම "තෙන සමයෙන බුද්ධො භගවා වෙරඤ්ජායං විහරති නාලෙරුපුචිමන්දමූලෙහි විනය නිදානං අභාසි"-පෙ-ඒ කාලයෙහි වනාහි භාග්‍යවත් බුදුරජානන්වහන්සේ වේරඤ්ජාවෙහි නාලෙරු (එනම් යක්ෂයාට වාසස්ථානවූ) කොසඹ වෘක්ෂමූලයෙහි වැඩවාසයකරවදාරති, යන විනයෙහි නිදානය වදාළසේක —පෙ— කායකම්ම වාක්කම්මයන්ගේ (ව්‍යතික්‍රමවශයෙන්) කම්පාවනලද ශික්ෂාමඇති **විනයපිටකය ප්‍රකාශකළසේක**(එසේ) ප්‍රකාශකොට ආයුඇතිතෙක් වැඩසිටිනුයේ බොහෝදෙනාට කියවා බොහෝදෙනාගේ හෘදයෙහි (සිත්හි) පිහිටවා නිරුපදිශේෂවූ නිර්වාණධාතුවෙන් පිරිනිවන්පෑසේක.

මෙසින්, **මහාමහෙන්ද්‍රස්ථවිරයන්වහන්සේ** විසින් ආරාධනාකරණලදුව, **මහාඅරිට්ඨස්ථවිරයන්වහන්සේ** විසින් **දෙවෙනිපෑතිස්ස** රජතුමන් සහිත ඉතා බොහෝවූ **ගිහිපිරිසක්ද** අසාගණසිටියදී සම්පූර්ණ විනයපිටකය දෙශනාකරණලද බැව් ඉතාපැහැදිලිව පෙණේ.

**මහාවංශයෙහි** ප්‍රාරම්භකථාවේ 15 වෙනි පිටේ.

"එකල් **යස**ස්ථවිරතෙමේ විනයෙහි අපරිද්දෙන් අනුද්ධතමහණකෙනෙකුන් ඉල්වාගෙණ ඒ මහණුන් එක්ව විසාලා මහනුවර ට පිවිස තමන්ධම්මවාදී බැව් ප්‍රකාශකෙරෙමින් බුදුන් වදාළ දෙ සූතුරක් හා **විනය ප්‍රඥප්තිසද උපාසකවරුන්ට වදාළසේක.**"

ගිහින්ට විනයකියාදීම වරදයකියන භික්ෂූන්ට ඒ සත්‍යලෙස ස්ථිරකරගැණීම පිණිස, දෙශනාපෙලෙන් හෝ, අට්ඨකථාවකින් හෝ, ටීකාවකින් හෝ සොයාගතහැකි ගාථාවක් හෝ පාඨයක් හෝ දකින්ට ලැබීනැත. නමුත් මහවග උපොසථඛන්ධකයෙහි "නභික්ඛවෙ සගහට්ඨාය පරිසාය පාතිමොක්ඛං උද්දිසිතබ්බං යොඋද්දිසෙය්‍යආපත්ති දුක්කටස්ස" යනමේ පාඨය, ඒ භික්ෂූහු ගිහි පිරිස් මධ්‍යයෙහි කියා, වරදවා භාවය ප්‍රකාශකොට "ගිහින්ට ශ්‍රමණවිනය කියාදෙන භික්ෂූන්ට දුක්කෘතාපත්තිවෙයි" කියාඔවුන් මුලාකරති. එහෙයින් ඒපාඨය සහිත නිදාන කථාවදක්වා භාවය ප්‍රකාශකරමු.

තෙනඛොපනසමයෙන දෙවදත්තො සගහට්ඨාය පරිසාය පාතිමොක්ඛං උද්දිසති, භගවතො එතමත්ථං ආරොචෙසුං, නභික්ඛවෙ සගහට්ඨාය පරිසාය පාතිමොක්ඛං උද්දිසිතබ්බං යොඋද්දිසෙය්‍ය ආපත්ති දුක්කටස්ස—භාවය—එසමයෙහි වනාහි

දෙව්දත්තෙර ගෘහස්ථයන් සහිත (භික්ෂු) පිරිසෙහි ප්‍රාතිමොක්ෂය උද්දෙසයි; භාග්‍යවතුන්වහන්සේට ඒ කාරණය (භික්ෂූහු) සැලකළාහුය. මහණෙනි, ගෘහස්ථයන් සහිත පිරිසෙහි ප්‍රාතිමොක්ෂය නොදෙසිය යුත්තේය, යමෙක් දෙසයිනම් ඔහුට දුෂ්කෘතාපත්ති වෙයි.

මෙයින් ප්‍රකාශවෙන්නේ (සීමාගතවූ) භික්ෂුසඞ්ඝයාගේ අත්පසෙහි ගෘහස්ථයන් සිටිද්දී, දෙව්දත්තෙරුන් ප්‍රාතිමොක්ෂය දෙසූ බවත්, එබවභික්ෂූන්වහන්සේලා සර්වඥයන්වහන්සේට සැලකළබවත්, ගිහින් සහිතභික්ෂුසඞ්ඝයා මධ්‍යයෙහි යම් භික්ෂූන්වහන්සේ නමක් ප්‍රාතිමොක්ෂයදෙසතිනම් (පෝයකරයිනම්) ඒ භික්ෂූන්වහන්සේට දුෂ්කෘතාපත්තිවන බවත්ය. ඒවිනා **ගිහින්ට ශ්‍රමණවිනයකියාදුන්නාට** ආපත්තිවන බවක් කිසිසේත් ප්‍රකාශනොවේ.

සිජ්කඩුවේ ශ්‍රීසුමඞ්ගලාභිධාන නායකාචාර්යයන්වහන්සේ විසින් "බුඩාගමේ ඉඳහණ විනය කියන අයද, ඒ අසනගිහියෝද මිථ්‍යාදෘෂ්ටිකයෝ වෙනවාය" යි කියනලද යුක්තිරහිත අනත නොමති මාත්‍රය, අයොනිසොමනසිකාරයෙන් යුක්තව පිළිගත් මොරගොඩ **රතනපාල** තෙරුන්නාන්සේ ආදි ප්‍රව්‍රජිතවරු කීප නමකට හා ගෘහස්ථයන් කීපදෙනෙකුටත් සත්‍යයයි වැටහුන නමුත්, පෙර විනයප්‍රඥප්ති දැනගත් මිථ්‍යාදෘෂ්ටිකයන්ප්වා සම්‍යක්දෘෂ්ටිකයන්වූවෝයයි, විනයපොත්හි ප්‍රකාශව තිබේ. මෙකල වසන ගෘහස්ථයන්ද විනය දැනගැණීමෙන් සම්‍යක්දෘෂ්ටියෙහි සෘජුව පැහැදී පිහිටීමද, කල්‍යාණමිත්‍රවූ සුපෙශල ශික්ෂාකාමී භික්ෂු සඞ්ඝයාවහන්සේගේ සෙවන භජන පයිරුපාසනයට පැමිණීමද, දුස්ප්‍රතිපන්න අප්‍රතිපත්‍යාදියෙහි නියුක්තව ශාසනහානිකරණ අසත්පුරුෂ පාපභික්ෂූන්කෙරෙන් වෙන්වීමද යනාදී මහත්වූ අර්ථසිද්ධකරණීත්.

**සමන්තපාසාදිකා භික්ෂුවිභඞ්ගයෙ ප්‍රථම පාරාජිකාවර්ණනාවෙහි**

අප්පසන්නානංවා පසාදායාති—සික්ඛාපද පඤ්ඤත්තියාහි ස තිසික්ඛාපද පඤ්ඤත්තිං ඤත්වා යථා පඤ්ඤත්තං පටිපජ්ජමානෙ භික්ඛූදිස්වා යෙපි අප්පසන්නා පණ්ඩිත මනුස්සා තෙ යානි වත ලොකෙ මහජනස්ස රජ්ජන දුස්සන මුය්හ නට්ඨානානි තෙහි ඉමෙ සමණ සක්‍යිය පුත්තියා ආරතා විරතා විහරන්ති දුක්කරං වත කරොන්ති භාරියං වත කරොන්තීති පසාදං ආපජ්ජන්ති-විනය පිටකෙ පොත්ථකංදිස්වා මිච්ඡාදිට්ඨිකා තිවෙදි බ්‍රාහ්මණාපිය-භාවය. "අප්පසන්නානංවා පසාදායාති" යනු ශික්ෂාපදපැණවීමඇති කල්හිවනාහී ශික්ෂාපදප්‍රඥප්තිය දැන, ශික්ෂාපදපැණවීම යම්සේද, එසේ පිළිපදින්නාවූ භික්ෂූන්දැක යම්බදු (ශාසනයෙහි) අප්‍රසන්නා

පණ්ඩිත මනුෂ්‍යයෝද, එවුනු යම්බඳුවූ ඒකාන්තයෙන් ලෝකයෙහි මහජනයා ඇලෙන දුක්ඛවන මූලාවන කාරණයන් ඇද්ද එසින් මේ ශ්‍රමණ ශාක්‍ය පුත්‍රයෝ දුරුව නොඇලිවසත්, ඒකාන්තයෙන් දුෂ්කර දෙයක් කරත්, ඒකාන්තයෙන් බැරෑරුම් (මැඩක්) කරත්යයි, **පැහැදීමට පැමිණෙත්** ( කෙසේදයත් ? ) විනය පිටකයෙහි පොත් දැක (පැහැදුනාවූ) **මිථ්‍යා දෘෂ්ටික** ත්‍රිවෙද දත් බ්‍රාහ්මණයාමෙනි.

ගෘහස්ථයන්ට විනය කියාදීම වරදය කියන සිප්කඩුවේ **නායක ස්ථවිරයන්වහන්සේම** ගෘහස්ථයන්ට **විනය කියාදී** තිබෙන බැව් උන්වහන්සේගේ අත්සන් සහිත ලිවුමකින් අපට දකින්ට ලැබී තිබෙන බැවින්ඒද මෙහි දක්වමු.

“මාතර කොටුවේ ගොඩ පොරොත්තු දෙන් පිලිප්පු මුහන්දිරම් ගෙයි **දොන් කරෝලිස්ට** සතුතඤදර පැවැත්වීමෙන් ලියා එවන කාරුණ්‍යනම්,

පසුගිය ඔක්තෝබර මස 31 වෙනි දින තුඹ විසින් මානවට එවන්ට යෙදුන ලියුම බලාගනිමි.................................................................අඞ්ගුත්තර නිකායේ සොක සල්ලාහරණ නම් සූත්‍රයෙහි “ජපෙන මන්තෙන සුභාසිතෙන අනුප්පදානෙන පවෙනියාවා, යත්‍ථයත්‍ථ යත්‍ථ ලභෙථ අත්‍ථං තත්‍ථ තත්‍ථ තත්‍ථ පරක්කමෙය්‍ය” යන ගාථාවෙන් භික්ෂූන්ට ජපමන්ත්‍රහොමාදිය කරන්නට කරවන්නට සර්වඥයන්වහන්සේ අනුදැන වදාළසේක කියා හෝ සූනියන්කැපීමද කුකුළුආදීන් බිලිදීමද යහපතකියාහෝ වැටහෙනම්, ඒ සූත්‍රයේ නිදාන පුද්ගලාදිය සමග අර්ථකථාවත් මනාලෙස තේරුම්ගෙණ ඒ සඳහා වෙන දෙශනාකර තිබෙන ධර්මයන්ද සොයා තේරුම්ගෙණ සැකහැර ගතයුතුයි. ඒ ගැණ ධර්ම විනයේ බොහෝතැන තිබෙන දෙශනාපාලි සහ අර්ථකථාද දක්වා ලියා එවීම ඉතාම උගහටයි. ඉන්නිසා මෙසඳහා තෙරුම්ගත යුතු ධර්ම විනය තිබෙන තැන් ස්වල්පයක් සඳහන්කරමි— අඞ්ගුත්තර නිකායේ තිකනිපාතයේ දෙවෙනි වර්ගයේ ප්‍රථම සූත්‍රය හා එහි අටුවාවද බලා සැකහැර ගතයුතුයි.

සූනියම් කැපුම් ආදිය කුමන කර්මයක්දැයි සොයා විභඞ්ගාන්තර්ගත චිත්තාගාර වර්ගයේ නවවන දසවන ශික්ෂාපද බලා එසින් කුමක් භික්ෂූන්ට හෝ භික්ෂුණීන්ට වටීදැයි සෙවියයුතුයි— සමන්තපාසාදිකා ආදියේ ඊට කියා තිබෙන විස්තර සෙව්යයුතුයි—සමන්තපාසාදිකා ආදියේ නියමකර තිබෙන ප්‍රයොග නියමයෙන් කුමක වැටේදැයි සෙවියයුතුයි. සිංහල කුඩුසික ආදියෙන්ද

අඹිදෙනි කතිකාවත් ආදියෙන්ද, ආචාර්‍ය්‍ය පරම්පරාවේ ස්ථවිර යන් විසින් පිළිගෙණ තිබෙන ක්‍රමය සෙව්ය යුතුයි. ඒ ඒ තැන් බණ්ඩාර්ථ දූනෙන ස්ථවිරාදීන්ගෙන් අසා සැකහැර ගතයුතුයි......†

මේවයට හිතෙෂිවූ,

හික්කඩුවේ **ශ්‍රී සුමඞ්ගලා**භිධාන, ශ්‍රී පාදස්ථා
නෙ සහ ගාලු පලාතේ නායක ස්ථවිරයෝය.
(අත්සන) H. SUMANGALA.

1889 නොවැම්බර් මස
12 වෙනි දිනදීය.

භික්ෂූන්ට සූනීසම් කැපුම් ආදිය කරවාගැණීමඉතා නොහො

---

† සිප්කඩුවේ **නායක** ස්ථවිරයන් වහන්සේ විසින් යථෝක්ත ලියුම් යවනලද්දේ, බැදිගම **රතනපාල** තෙරුන්නාන්සේ සූනියම්කප්පවානත් කරුණ අරබයාය. “බෞද්ධ භික්ෂූන්වහන්සේ කෙනෙක කියමින් වසන **රතනපාල** තෙරුන්නාන්සේ කරවාගත් මේක්‍රියාව මහාසාවද්‍යයක්ය”යි, ආනමදත් බොහොදෙනෙක් දෙස් පවරන්ට පටන්ගත්තෝය. එකල්හි **රතනපාල** තෙරුන්නාන්සේ “භික්ෂූන්ට සූනියම් කප්පවාගැණීමටද, ජපමන්ත්‍ර හෝමාදියකරවාගැණීමටද බුද්ධාගමේ ප්‍රකාරයට අවකාශතිබේය”යි, ධර්මයඅධර්මයකොටද, විනයඅවිනයකොටද, ලාමකදෙශනාවක්කලේය. ඒදෙශනාව ප්‍රසිද්ධවශයෙන් පිළිගත්අයනම්, මාතර පලාතේ එක්තරා **නොනාරිස්** කෙනෙක් සහ **වෙදආරච්චි** කෙනෙකුත්පමණය. තිසරණගත උපාසකයාපවා “කොතුහලමඞ්ගලික” සඞ්ඛ්‍යාත ජපමන්ත්‍රහෝමද, සූනියම් කප්පවාගැණීමාදියද කෙරේනම්, කරවාගණීනම්, ඔහු උපාසක චණ්ඩාලයෙක්වේයි, උපාසකමලයවෙයි, උපාසක පිළිකුලවෙයි. වදාරා තිබේ. ඒඑසේහෙයින් උපසම්පන්නභික්ෂූන්වහන්සේ නමක්යකියන **රතනපාල** තෙරුන්නාන්සේට ශාසනිකවූ යම් භික්ෂුභාවයක් තිබේනම්, එය ඈතම්වට සර්වප්‍රකාරයෙන්ම මූලොච්ජින්න වීමට හෙතුවූ, සූනියන් කප්පවාගැණීම, විනය දන්නම් වරද වශයෙන් නොසැගුණාටපුදුමවෙමු. මෙකීනිරශ්විනක්‍රියාව **රතනපාල** තෙරුන්නාන්සේ කරවාගත්තාට පසු මාතර පලාතේවැසි තවත් **ස්‍යාමනිකායික භික්ෂූහු** කීප නමක්ම, කුකුළු ආදීන් බිලිදීම්කොට, ඒ කරවාගත්බව ඇසිමු. “එකෙක්හුගේ ක්‍රියාවදැක, අනිකෙක් නින්දිත ක්‍රියාවකෙරෙයි” යන ආදේශොපදෙශය සලකනවිට ඔවුන්විසින් ඒ කරවාගන්නාලද්දේ, අරුමයක්නොවෙයි.

තිනබව තේරුම්ගැණීමට ධම්මවිනයේ බොහෝතැන තිබෙන දෙශනා පාලි සහ අර්ත්‍ථකථාද, දක්වා **ලියන්ට** තිබෙන අපහසුකමක් කරණකොටගෙණ **නායක** ස්ථවිරයන්වහන්සේ ඒ නොලියූවා විනා, ගිහින්ට විනය කියාදීමට තහනමක් ඇතිබව ලියා නැත. ඒ සඳහා යම බඳු තහනමක් තිබේනම්, එබවද හඟවා ලියනවා ඇත. එසේ කිසිතහනමක් නැති බැවින්, පොත් හා වර්‍ණනාදිය දක්වා ඒඒතැන්වල ඇති **ශික්ෂාපද** "ධම්මාඍදූනෙන **ස්ථවිරයින්ගෙන්** අසා සැකහැර ගතයුතුය"යිද ලියූවේ, ගිහිනට විනය කියාදීමට කිසි තහනමක් නැතිහෙයින්ය. මේ කාරුණු මෙසේ ලියා තිබෙන බැවින් "විනය ගිහින්ට කියාදීම තහනම්ය"යි **නායක** ස්ථවිරයන්වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද්දේ, ඍජු අදහසකින් යුක්තවයයි නොසිතමු.

විනය ගිහින්ට කියාදීම වරදය කියන ප්‍රව්‍රජිතවරුන් විසින් "**චෙලාසුඛස**"මෙන් සලකා ඒ පිණිස නිදර්ශනකොට දක්වනලද්දේ, මිලින්ද ප්‍රශ්නයෙහි තිබෙන "පාතිමොක්ඛුද්දෙසො" යනාදී පාඨයයි ; එය කිනම් දෙශනා පොතක තිබේදැයි, යමෙක් විචාලාම උත්තර නොදෙති. මේ පාඨයඅරබයා පසුගියකාලයෙහි අපට නොයෙක් සැක ඉපදී සර්වඥදෙශිතපාලිය අන්තර්ගතවූ කිසි පොතක ඒ ඇද්දයනු නිසැකව දැනගැණීම සඳහා සිප්කඩුවේ **නායක** ස්ථවිරයන්වහන්සේ වෙත ලියුමක්යවා විචාරණලද නමුත් ඊට මෙ දක්වා කිසි උත්තරයක් නුදුන් බැවින්ඒ ලියුමද මෙහි දක්වනු ලැබේ.

"ත්‍රිසරණානුසම්‍ර්තියෙන්, සිප්කඩුවේ ශ්‍රී සුමඞ්ගලාභිධාන නායක ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ වෙත යටහත්භාවයෙන් ලියා ඔප්පුකරණ වගනම්.

ගෞරවනීයවූ පින්වතුන්වහන්ස,

බුද්ධ සමය ඉගෙණ ගැණීමට අභිලාෂීවූ මාවැන්නවුන්ට, යම් ධර්‍මසැකයක් උපන්කල්හි, ඒ දැනුම්දී විනොදනය කරවාගන්නට බහුශ්‍රැතධාරවූ පින්වතුන්වහන්සේ ඉතා අවශ්‍ය බව තුලක සිම මසිතට වැටහී තිබේ. එබැවින් මෙහි පහත සඳහන්කරණ කාරණයට පිළිතුරු දෙවාවදාරණමෙන් යාච්ඤාකරමි.

මිලින්ද ප්‍රශ්නයෙ "විනය පටිච්ඡන්නා"නම් ප්‍රශ්නයෙහි "පාතිමොක්ඛුද්දෙසො කෙවලංච විනයපිටකං පිහිතං පටිච්ඡන්නං"යන පාඨය, සර්වඥයන් වහන්සේ විසින් වදාළ සේක්ද ? එසේ වදාළානම්, ඒකිනම් දෙශනා පොතක තිබේද ? දෙශනා පොත

ක්ව ඇතුලත්නොවී අනුශ්‍රැතියෙන්ගෙණවිත් මිලින්ද ප්‍රශ්නයට අ ඩංගු කරණ ලද්දේද ? ඉදින් ! ඒ පාඨය ඉතා බැරෑරුම් කරුණක් පිළිබඳ බැව්හ් හා මිලින්ද ප්‍රශ්නය, **සඞ්ගායනානුසටම නොනැ ගුණ** පොතක්වන බැව්නුත් එපමණින් පිළිගතයුතුද ? පිළිගත යුතුනම් ඊට කාරණ කවරේද ?

මේගැණ කාලක්‍ෂෙපනොකොට පැහැදිලි ලෙස පිළිතුරු දෙවාවදාරණමෙන්, යලිත් යාච්ඤාකරමි.

මේවගට, කිකරුවූ
(අත්සන) P. A. Peiris.

1891 ක්වූ සැප්තැම්බ්‍ර මස
4 වෙනි දින **මාගරදීය.**

"ප්‍රාති මොක්‍ෂය සහිත සකල විනය පිටකය පටිච්ඡන්නය" කියන ඒ පාඨය, සර්වඥයන්වහන්සේ විසින් **නොවදාල** බව එකා න්ත වශයෙන් කල්පනා කෙරීම පිණිස මෙහි පහත දක්වන ධර්මාන්විතවූ කරුණු දෙකද අත්‍යන්තොපකාරීවේ.

1. වෙනුව : — සර්වඥයන්වහසේ විසින් වදාරණලද පාලිය යම්පමණක්ද ඒසියල්ලක්ම, ප්‍රථමධර්ම සඞ්ගායනාකාලයෙන් ඔබ්බෙහි,නොගොතාපූ මල්රැසක්මෙන් තිබුණේය. එබඳුවූ ශ්‍රීබුද්ධපාලිය සඞ්ගායනා කල **මහාකාශ්‍යපාදී** ක්‍ෂීණාශ්‍රව ස්ථවිරපාදයන් වහන්සේලා විසින් ප්‍රධාන කොටස් වශයෙන්, සූත්‍ර පිටකය, අභිධර්මපිටකය, විනයපිටකය, යන කොටස් තුණකට වෙන්කරණ ලද්දේය, එසේ වෙන්කල පාලියට, ප්‍රධාන නමක් වශයෙන් සර්වඥයන්වහන්සේ ව්‍යවහාරකළේ "**ධම්මවිනයො**" කියාය. එවිනා "විනය පිටකං" යනාදි පිටකනාමයක් ඊට ව්‍යවහාර නොකළසේක. ඒ එසේ හෙයින්, මිලින්ද ප්‍රශ්නයේ යථොක්ත පාඨයෙහි "**විනය පිටකං**",.යනු තිබෙන නිසා ඒ පාඨය බුද්ධ වචනයක් නොවන බැව් පැහැදිලියි.

2. වෙනුව : — යථොක්ත පාඨය සතර මහා අප දෙශ ධර්මයන්ගෙන් "**බුද්ධඅපදෙශ**" නම්වූ පළමුවෙනි මහා අප දෙශ ධර්මයට සංසන්දනය වේද ? යනු පරීක්‍ෂාකාර බැලිමු. එසේ පරීක්‍ෂා කරණකල, ඒ පාඨයෙන් විනය පිටකය (අනුපසම්පන්නයන්ට) පටිච්ඡන්නයයි, ප්‍රකාශවන නමුත් "සූත්‍ර පිටකය (ඔවුන්ට) පටිච්ඡන්නය"යි ප්‍රකාශ නොවේ. එහෙයින් එය මැදුම් සඟියෙහි "**සාමගාම, ගනක මොග්ගල්ලාන**" සූත්‍රාදියට නොගැළපේ. දෙශනා අටුකථාදියෙහි **විනය අපටිච්ඡන්න** බැව් සඳහා ඇත්තාවූ (මෙහි සට දක්වූ) ධර්ම සූක්ති නොසලකා යථොක්ත පාඨයවූ පරිද්දෙන්

අනුප සම්පන්නායත්ව විනය පිටකය පටිච්ඡන්නාය කියන්නවුන් විසින් **සජ්නාපන්නිස්කන්ධයෝම** ප්‍රකාශිතවූ සාමනාම සූත්‍රාදියත් අනුප සම්පන්නායතට පටිච්ඡන්නායයි කියන්ට ඕනෑ නොවේද? මේ ආදිකරුණු මනා සිහියෙන් සූක්ෂමව කල්පනා කරණ අයට මිලින්ද ප්‍රශ්නයෙහි තිබෙන ඒ පාඨය සර්වඥයන්වහන්සේ නොව දෑලේ්මයයි හැඟේ.

සර්වඥයන්වහන්සේ විසින් හෝ අර්ථකථාචාර්යයන් වහන්සේලා විසින් හෝ ගිහින්ට ශ්‍රමණ විනය කියාදීම කිසි පරිද්දකින් තහනම් නොකරණලද බැව් යටදැක්වූ කාරණයන්ගෙන් නිශ්චයවූයේය. ඉදින්! යම් කිසි පරිද්දකින් ඔවුන්ට ඒ දැනගැණීම තහනම්කර වදාරණලද නම්, ලෝක ශාසන දෙක නසන්නාවූ අලජ්ජී දුශ්ශීල ශ්‍රමණයන් හැඳිනගන්ට අන්කිසි හෙතුවක් නොවැන්සි. සර්වඥයන් වහන්සේ විසින් දෙකොණ ගිනි ඇවිලී මැද අසූචි තැවරුණාවූ ගමෙහි හෝ ආරණ්‍යයෙහි හෝ කිසි දෘරුකෘත්‍යයකට නොගන්න **අවගුල් ප්‍රමාණ සොහොන් පෙනෙල්ලට උපමාකර** වදාරණ ලද්දාවූ දුශ්ශීල ශ්‍රමනයන් හැඳිනගණ ඔවුන්ගෙන් වෙන්වීමට **අසහාය** හෙතුවක්වනබෙන්නේ **විනය දැනගැණීම**මයි. එසේවූ විනය ගිහින් විසින් දැනනොගන්නා ලදනම්, දුශ්ශීල ශ්‍රමණයන් සඳහා දෙශනා අර්ථකථාදියෙහි නොයෙක් තන්හි ප්‍රකාශිතවූ ධර්මයන්ගෙන් ඔවුන්ට ප්‍රයෝජන ලබාගැණීම නුපුළුවන්වෙයි ; එසේවූ විට ඔවුන්ට අනර්ථ ගෙණදෙති.

දුශ්ශීල ශ්‍රමණයන් පිළිබඳව බොහෝ ධර්මදෙශනා කරවදාළේ, ලෝකශාසන දෙකට ඔවුන්ගෙන් මහත්වූ **අනර්ථ** පැමිනෙන්නසාමයි. ගිහින්ට විනයදැනගැණීම තහනම්කර වදාරණ ලද්දේනම්, දුශ්ශීල පාප ශ්‍රමණයන් හැඳිනගණ ඔවුන්ගෙන් වෙන්වෙන්නේ, අන්‍යවූ කවර ධර්මතාවයක් කරණකොට ගෙණද? චන්ද්‍ර සූර්යයන්මෙන් සියල්ලන් අතරට **වැසීමක් නැත්තාවූ විනය** මෙකල වසන බොහෝ භික්ෂූන් විසින්ගිහින්ට පටිච්ඡන්නාය කියන ලද්දේ, ඒ භික්ෂූහු විනය ප්‍රඥප්ති වලට **විරුද්ධව** හැසිරෙමින් ලොසසුන් නසන පාපයෝයයි, ගිහියෝ තේරුම් ගෙණ සිවුපස උපස්ථාන නොකර හරින්යන බියෙන්ය. භික්ෂූන්ගේ සුශීල දුශ්ශීලභාවයන් දැනගන්නට නුපුළුවන්වූ විනය නොදත් මූඪ ගෘහස්ථයන් රවටා දුෂ්ටාත්ම ගතියට බැඳගණ ඔවුන්ගෙන් සිවුපස ලබා පරිභොග කරණ දුශ්ශීල භික්ෂූහු, ඓහලෞකික වශයෙන් සැපයකි සම්බන්ධකොට ශරීර සන්තර්පණය කරගණිතත් පරලෙව්හිදී, අග්

භික්ඛන්ධොපම සූත්‍රාදියෙහි දක්වා වදාල ඝොරවූ අපායදුකින් නොමිදෙත් ; ඒ එසේමයි.

**ඒ සඳහා විශුද්ධි මාර්ගයෙහිද-**

අග්ගික්ඛන්ධාලිඞ්ගන දුක්ඛාතිදුක්ඛං කටුකප්ඵලං

අවිජහතො කාමසුඛං සුඛංකුතො භින්නසීලස්ස.-**භාවය**

ඉන්ද්‍රියයන් නැලවීමෙහි නොහොත් පස්කම් සැපන අත් නොහරින්නාවූ, දුශ්ශීලයාට ගිනිකඳක් වැලඳ ගැණීමෙහි දුකටත් වඩා අතිශයින් දුක්වූ කර්කශ විපාක ඇත්තේය ; එසේ ඇතිකල සැපතක් කොයින්ද ?

අභිවාදන සාදියනෙ කිංනාමසුඛං විපන්නසීලස්ස

දළ්හවාල රජ්ජුඝංසන දුක්ඛාතිදුක්ඛ භාගිස්ස.-**භාවය.**

දැඩිවූ වාලරැහැණකින් පාබැඳ ඇද ඇඹිදීමේ දුකට වඩා දුකකට නොහොත් අවීචිමහ දුකට කොටස්කාරයෙක්වූ දුශ්ශීලයාට සැදැහැතියන්ගේ පසඟ පිහිටුවා වැඳීම ඉවසීමෙන් කවරනම් සැපතක්ද ?

සද්ධානමඤ්ජලිකම්මං සාදියනෙ කිං සුඛං අසීලස්ස

සත්තිප්පහාරදුක්ඛාධිමත්තදුක්ඛස්සයං හෙතු.-**භාවය-**

ලයමැද කඩුපහරක් හෙළීමෙහි දුකට වඩා අවීචිමහ නරකයෙහි දුක්ඛාස්වාදනයට හේතුවූ, සැදැහැතියන්ගේ දෙඅත් මුදුනේ තබා වැඳුම ඉවසීමෙහි භින්නසීලි දුශ්ශීලයාට කුමණ සැපතක්ද ?

චීවරපරිභොගසුඛං කිංනාම අසඤ්ඤතස්සයෙන

චිරමනුභවිතබ්බා නිරයෙ ජලිත අයොපට්ටසම්ඵස්සා,-**භාවය-**

යමෙක් විසින් අවීචිමහ නරකයෙහි ගිනිගෙණ දිලිසෙන්නාවූ යකඩ සිවුරගේ ස්පර්ශයො බොහෝ කලක් අනුභවකටයුත්තාහුද එබඳු දුශ්ශීලයාට මෙලෙව්හිදී සැදැහැතියන් විසින් දෙනලද සිවුරු පරිභරණයෙහි කවරනම් සැපතක්ද ?

මධුරොපි පිණ්ඩපාතො හලාහලවිසූපමො අසීලස්ස

ආදිත්තා නිලිතබ්බා අයොගුළා යෙනචිරරත්තං.-**භාවය-**

යමෙක් විසින් බොහෝ දීර්ඝකලයක් මුළුල්ලෙහි අවීචිමහ නරකාග්නියෙන් රත්වූනාලද යකඩ ගුලි අනුභවකට යුත්තාහුද එබඳු දුශ්ශීල ශ්‍රමණයාට සැදැහැතියන් විසින් දෙනලද මිහිරි රස ඇත්තාවූද පිණ්ඩපාතය දරුණු විෂය සමානයහ.

සුඛසම්මතොපිදුක්ඛො අසීලිනොමඤ්චපීඨපරිභොගො

යංබාධිස්සන්තිචිරං ජලිතඅයොමඤ්ච දුක්ඛානි.-**භාවය-**

නරකාග්නියෙන් ගිනිගෙණ දිලිසෙනලද යකඩ ඇඳනිඳිමෙන් ඇති වන දුක්ඛයෝ යම් පුහුලෙකු කලක් මුළුල්ලෙහි පෙළද්ද, ඒ දුශ්ශීල ශ්‍රමණයාට සැපයයිද සම්මත කරණ ලද්දාවූ ඇඳපුටු පරිභොගය දුක්මය.

දුස්සීලස්ස විහාරෙ සඞ්ඝදෙය්‍යම්හි කානිවාසරති
ජලිතෙසු නිවසිතබ්බා යෙනඅයො කුම්භිමපෙක්ඛසු.-භාවය
යමෙක් එසින් නරකාග්නියෙන් දිලිසෙනලද ලොහොකුම්භනරක යමැද බොහෝකලක් වාසයකල යුතුද එබඳු දුශ්ශීලයාට ශ්‍රද්ධාව න්තයන් එසින් දෙනලද විහාරයෙහි නිවාසයෙන් නොහොත් එසීමෙහි කැමත්තෙන් ඇති ප්‍රයොජනය කුමක්ද ?

සඞ්කස්සර සමාචාරෙ කසම්බුජාතො අවස්සුතො පාපො
අන්තොපූතිතිච්චයං නිඤ්ඤතො ආහලොකගුරු -භාවය-
දෙව්මිනිසුන් සහිත ලොකයාට ගුරුවූ සර්වඥතෙම යමෙකුට නින්දාකරමින් සැකකට යුතු හැසුරුම් ඇත්තෙක, හටගත් රාගාදි කසල ඇත්තෙක, රාගාදී කෙලශයෙන් තෙත්වූයෙක, පාපයෙක, අභ්‍යන්තරයෙහි රාගාදී කෙලශයෙන් කුණුවූ (දුශ්ශීල) යෙකැයි වදාලේද ?

කිංජීවිතං අබ්භුස්ස තස්සචස්සමණජන වෙසධාරිස්ස
අස්සමණස්ස උපහතං ඛතමත්තානං වහන්තස්ස -භාවය-
ශ්‍රමණ ජනයාගේ වෙශයදරන්නාවූ, කාලකන්නිවූ අශ්‍රමණවූ නෂ්ටගුණ ඇත්තාවූ නොහොත් සියලු ගුණයෙන් සුන්වූ ආත්මය උසුලන්නාවූ ඒ ශ්‍රමණ දුශ්ශීලයාගේ ජීවිතයට නින්දාවේවා !!

ගූථංවිය කුණපංවිය මණ්ඩනකාමා විවජ්ජයන්තිධ
යංනාමසීලවනෙතා සන්තො කිංජීවිතංතස්ස -භාවය-
මේලොකයෙහි ශීලවත්තවූ ශීලාලඞ්කාරයෙන් සැරසෙනු කැමැත්තාවූ සත්පුරුෂවූ දිව්‍ය මනුෂ්‍යයෝ යම් දුශ්ශීලයෙක් අසූචි ගොඩක්මෙන් ගැරඬිකුණපාදි කුණපයක්මෙන් විශෙෂයෙන් දුරුකරද්ද, ඒ ශ්‍රමණ දුශ්ශීලයාගේ ජීවිතයෙන් ඇතිකම් කිම ? කුමන ජීවිතයක්ද ?

සබ්බභයෙහි අමුත්තො මුත්තො සබ්බෙහි අධිගමසුඛෙහි
සුපිහිතසග්ගද්වාරො අපායමග්ගං සමාරුළ්හො-භාවය-
ඒ ශ්‍රමණ දුශ්ශීලතෙම සියලුසංසාරභයින්, අපායභයින්, නොමිදුනේය, සියලු අධිගම සැපයෙන් (යටත් පිරිසෙයින් භාවනානුයොගයේ පටන්) මිදුනේය, පිරිහුනේය, මනාකොට වසනලද,

ස්වර්ග දොර හෙවත් ස්වර්ගමාර්ගයට යනපාර ඇත්තේය අපාය මාර්ගයට මනාකොට නැත්තෙක, (පැමිණ සිටින්නෙක)

කරුණාය වතත්වභූතො කාරුණිකජනස්සනාමකො
අඤ්ඤො දුස්සීලසමො දුස්සීලතාය ඉතිබහුවිධාදෙසා-භාවය

කරුණාත්විතජනයාගේ දුක්ඛිත සත්වාලම්බනයෙහි උපදින්නාවූ කරුණාවට වසතුවූයේ දුශ්ශීලයා සමාන අනික් කවරෙක්ද ? (අදෙමය ! ශ්‍රමණ දුශ්ශීලයාට මතුභවයෙහි ඇති වන සතර අපාදුක කල්පනාකරණ කවර කරුණාවන්තයෙකුගේ ලය කම්පානොවේද ?) මෙසේ දුසසීලභාවයාගේ බොහෝ ප්‍රකාර දෙෂයෝ වෙත්.

මෙබඳුවූ දුසසිල භික්ෂූන් සෙවනාදිය කරමින් ඔවුන්ගේ අවවාද අනු ශාසනාලෙස ක්‍රියා කරන්නාවූ දයකාදිහුද මරණින් මතු අපාය භාගීවෙති.

සූත්‍ර නිපාත අටුවාවෙහි


යථාදීඝවිදසසභාතා චතු බුඩතන්තරං සට්ඨියොජනමතෙතන අත්තභාවෙන උත්තානොපත්තිතො මහානිරය පචති. යථාවතස්ස දිවසිං අභිරුචිතානි පඤ්චකුල සතානිතසෙව සහව්‍යතං උපපන්නානි මහානිරයෙ පචනති-භාවය.-

යම්සේ මහණදම් වරදවා පිළිපැදවූ "දීඝවිදශීභාතෘ" නම් පැවිදු මහණතෙම බුඩානතර සතරක් මුළුල්ලෙහි සැටයොදුන් ආත්ම භාවයෙන් උඩුකුරුව වැටී මහනිරයෙහි පැසේද, එමෙන්ම ඔහුට (උපස්ථාන කිරිගමන් හා ඔහුගේ අවවාද අනුසාසනාලෙස ක්‍රියාකිරීමෙන්) දැඩිවානු ගතියට බැඳුනු පන්සියයක් කුල වාසීහුද ඔහුඉපිද දුක්විඳින මහනරකයෙහි ඉපද පැසෙත්.

යථොක්ත ප්‍රකාරයෙන් දැක්වූ කරුණු නියවා බලනලද සත් පුරුෂවූ මිත්‍රවරුන් විසින් දුශ්ශීල පාප ශ්‍රමණයන් සෙවන, භජන, පර්යුපාසනය කෙරීමෙන් දුරින්ම දුරුවී ලජ්ජී ප්‍රිය ශීලී භික්ෂූන්වහන්සේලාගේ සෙවනාදියට පැමිණිය යුතුයි. එසේ පැමිණ උන්වහන්සේලා විසින් කරණලද අවවාද අනුසාසනාවෙහි පිහිටා, දානාදී පින්කම්කොට උතුම්වූ අමෘත මහා නිර්වාණ සැප ස්වකරගැණීමට උත්සාහ කටයුතුයි.

නි මි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු